


| හඳහන | ධන නිධානය | අද කෝටිපති | ලග්න වාසනාව | මහජන සම්පත | ගොවිසෙත | මෙගා පවර් | ලකී 7 | අද සම්පත | සුපර් බෝල් | කප්රුක | ශනිදා වාසනාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2024 - 11 - 28 | 2024 - 11 - 28 | 2024 - 11 - 28 | 2024 - 11 - 28 | 2024 -11 - 28 | 2024 - 11 - 28 | 2024 - 11 - 28 | 2024 - 11 - 28 | 2024 - 11 - 28 | 2024 - 11 - 28 | 2024 - 11 - 28 | 2024 - 11 - 28 |
| දිනුම් වාරය 978 | දිනුම් වාරය 1699 | දිනුම් වාරය 2469 | දිනුම් වාරය 4355 | දිනුම් වාරය 5669 | දිනුම් වාරය 3911 | දිනුම් වාරය 2017 | දිනුම් වාරය 495 | දිනුම් වාරය 244 | දිනුම් වාරය 2643 | දිනුම් වාරය 1819 | දිනුම් වාරය 4804 |
| 33 55 60 61 | 08 22 37 55 | 06 27 28 74 | 28 35 38 54 | 1 0 1 6 5 6 | 31 41 64 78 | 05 04 12 17 33 | 4 4 7 2 9 3 | 1 6 5 6 | 19 63 66 72 | 28 20 22 38 72 | 19 25 34 50 |
| ලග්නය - වෘශ්චික | අක්ෂරය Y | අක්ෂරය G | ලග්නය - සිංහ | අක්ෂරය - E | අක්ෂරය E | අක්ෂරය M | අක්ෂරය B | අක්ෂරය E | අක්ෂරය P | අක්ෂරය V | අක්ෂරය N |

දුම්රිය මාර්ගයට කඩාවැටී ඇති පස්කඳු බැකෝයන්ත්‍රයක් මඟින් ඉවත් කරමින්

# බදුලු දුම්රිය බණ්ඩාරවෙලින් නවතී



හාලිඇළ - දෙමෝදර දුම්රිය මාර්ගයට පස් කන්දක් කඩාවැටී ඇති අයුරු

## බදුල්ල දෙමෝදර දුම්රිය ධාවනය යථා තත්ත්වයට පත් කිරීමට තව දින කීපයක් ගත වන ලකුණු

**සොරණාතොට සමූහ - සී. ගමගේ**

පස්කඳු හා ගල්පර්වත කඩාවැටීමෙන් අවහිර වී ඇති උඩරට දුම්රිය මාර්ගයේ බදුල්ල සහ දෙමෝදර දුම්රිය ධාවනයට තව දින කීපයක් ගත වන හෙයින් කොළඹ කොටුව බදුල්ල අංක 1045 රාත්‍රී තැපැල් දුම්රිය සහ බදුල්ල කොළඹ කොටුව අංක 1046 රාත්‍රී තැපැල් දුම්රිය දැනට කොළඹ කොටුව බණ්ඩාරවෙල දුම්රිය ස්ථානය දක්වා පමණක් ධාවනය වන බව නාවලපිටිය දුම්රිය පාලක මැදිරිය ඊයේ (29) නිවේදනය කළේය. ඒ අනුව බණ්ඩාරවෙල සිට රාත්‍රී 8.00ට අංක 1046 දරන රාත්‍රී තැපැල් දුම්රිය කොළඹ කොටුව බලා ධාවනය වන බවද නාවලපිටිය දුම්රිය පාලක මැදිරිය පවසයි.

බදුල්ල දිස්ත්‍රික්කයට පතිත වූ ධාරානිපාත වර්ෂාවත් සමඟ උඩරට දුම්රිය මාර්ගයේ හාලිඇළ හා දෙමෝදර අතර දුම්රිය මාර්ගයට ඉකුත් 25 දින විශාල පස්කන්දක් කඩාවැටීමෙන් බදුල්ල දෙමෝදර අතර දුම්රිය ධාවනය මේ වන විටත් මුළුමනින්ම ඇනහිට තිබේ. නානුඔය ප්‍රධාන දුම්රිය මාර්ග අධීක්ෂණ කළමනාකරු ඇන්ටන් විරෝෂන් වික්‍රමරත්න මහතා ඇතුළු නිලධාරීන් පිරිසක් ඊයේ (28) පස්වරුවේ මේ ස්ථානයට පැමිණ පරීක්ෂා කරමින් එම පස්කඳු ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළහ.

කෙසේ වෙතත් එම දුම්රිය මාර්ගයට පස්කන්ද කඩාවැටුණු ස්ථානයයේ ජල පහරක් තවමත් ගලා යමින් නායයෑම සක්‍රීය මට්ටමේ ඇති බවත්, එම පස් ඉවත් කිරීමේදී තව දුරටත් පස්කඳු කඩාවැටෙන බවත් දුම්රිය බලධාරීහු කීහ. දැනට බැකෝ යන්ත්‍රයක් මාර්ගයෙන් මේ පස් ඉවත් කරන බවත්, එම ස්ථානයේ ඉඩකඩ ප්‍රමාණවත් නොවන නිසා ඉවත් කරන පස් දැමීමට එම ස්ථානයේ ඉඩකඩ නැති නිසා පස් වෙනත් ස්ථානයකට රැගෙන යෑමට සිදුව ඇති බවද පැවසීය.

එමෙන්ම විශාල පස්කන්දක් කඩා වැටී ඇති හෙයින් එම ස්ථානයට ළඟා වීමට ගල් අතුරා වෙනම මාර්ගයක් සකස් කිරීමට සිදු වූ බවත්, උඩරට දුම්රිය මාර්ගයේ බදුල්ල දෙමෝදර දුම්රිය ධාවනය යථා තත්ත්වයට පත් කිරීමට තව දින කීපයක් ගත වන බවත් දුම්රිය බලධාරීහු සඳහන් කළහ. තවදුරටත් පවතින වර්ෂාව එම කටයුතුවලට බාධාවක් වී ඇතැයි දුම්රිය දෙපාර්තමේන්තුව වැඩිදුරටත් සඳහන් කළේය.

කෙසේ වෙතත් දැනට දුන්හිඳ, ඇල්ල ඔඩිසි දුම්රියන් ඇල්ල කොළඹ කොටුව අතරත්, පොඩිමැණිකේ, උඩරටමැණිකේ, විශේෂ ශීඝ්‍රගාමී දුම්රිය මෙන්ම භාණ්ඩ ප්‍රවාහන මිශ්‍ර දුම්රිය නානුඔය සිට කොළඹ කොටුව, මහනුවර දක්වාද ධාවනය වන බව නාවලපිටිය දුම්රිය පාලක මැදිරිය පවසයි.

# පුත්තලමේ පවුල් 7,000ක් ජල ආපදාවෙන් අවතැන්

**පුත්තලම අතිරේක - හිරාන් ප්‍රියංකර ජයසිංහ**

මහ වැසි මැද දැදුරු ඔය පිටාර සහ වැව් පිටාර ගැලීම් හේතුවෙන් පුත්තලමේ දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරී වසම් 140ක පවුල් 6,969ක 22,708 දෙනකු පීඩාවට පත්ව ඇති බව පුත්තලම දිස්ත්‍රික් ලේකම් එච්.එම්.එස්.පී. හේරත් මහතා පවසයි.

දැදුරු ඔය මේ ආකාරයෙන් අවසන් වරට පිටාර ගලා ඇත්තේ ඉකුත් 2016 වසරේදී බවද වාර්තා වෙයි. මේ අයහපත් කාලගුණ තත්ත්වය හේතුවෙන් වැඩිම පිරිසක් ආපදාවන්ට ලක්ව ඇත්තේ පුත්තලම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ වන අතර එහි ග්‍රාම නිලධාරී වසම් 11ක පවුල් 2,312ක 6,136 දෙනකු පීඩාවන්ට පත්ව ඇත්තේ ගලා ආ ජලය නිසි ලෙස බැස නොයෑම හා නෙඩුම්කුලම් වැව පිටාර ගැලීම හේතුවෙනි.

එසේම පුත්තලම නගරයේ ජලය බැස යෑමට තිබූ ස්ථාන විවිධ පිරිස් අවහිර කරමින් විවිධ ඉදිකිරීම් කිරීම මේ ගංවතුර තත්ත්වයට තවත් හේතුවක්ව ඇත. ඒ සමඟම මුන්දලම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රාදේශයේද ග්‍රාම නිලධාරී වසම් 24ක පවුල් 992ක 3,635 දෙනකු පීඩාවන්ට ලක්ව තිබේ. එයට අමතරව දැදුරු ඔය පිටාර ගැලීම හේතුවෙන් පල්ලම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වසම් 4ක පවුල් 343ක 1,121 දෙනකු අසරණ කර ඇත්තේ ගලා ආ දැවැන්ත ජල කඳට නිවාස ජලයෙන් යට වීම හේතුවෙනි. ඒ සමඟ වෙන්නප්පුව ග්‍රාම නිලධාරී වසම් 24ක පවුල් 618ක 2,374 දෙනෙක් පීඩාවන්ට ලක් වී සිටිති. එසේම හලාවත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේද ග්‍රාම නිලධාරී වසම් 12ක පවුල් 719ක 2,635 දෙනෙක් පීඩාවට පත්ව සිටිති. එයට අමතරව කල්පිටිය ග්‍රාම නිලධාරී වසම් 11ක පවුල් 655ක 2,315 දෙනකු පීඩාවන්ට ලක් වී ඇත.

එයට අමතරව දැදුරු ඔය පිටාර ගැලීම හේතුවෙන් ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රාදේශයේ ග්‍රාම නිලධාරී වසම් 5ක පවුල් පවුල් 410ක 1,618 දෙනෙක් බරපතළ පීඩාවට ලක් සිටිති. මෙයට අමතරව මහවැව, දංකොටුව, නාත්තන්ඩිය, වනාතවිල්ලුව, කරුවලගස්වැව, මාදම්පේ යන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශවල ග්‍රාම නිලධාරී වසම් 60ක 2874 දෙනකු බරපතළ පීඩාවන්ට ලක්ව ඇති බව දිස්ත්‍රික් ලේකම්වරයා පැවසීය. මේ තත්ත්වය හමුවේ 1500කට ආසන්න පිරිසකට පිසූ ආහාර සැපයීමට කටයුතු කරමින් ඇති බවද ඔහු ප්‍රකාශ කළේය.

## පල්ලමට ආ දැදුරු ඔය



දැදුරු ඔය ජලාශයේ වාන් දොරටු විවෘත කිරීමත් සමඟ තප්පරයට ජල ඝන අඩි 48,000ක දැවැන්ත ජල කඳක් ගලා විත් පල්ලම ප්‍රදේශයේ ගම්මාන ජලයෙන් යටව තිබූ අයුරු කැමරා ඇසේ සටහන් වූයේ මෙලෙසනි.
*පුත්තලම අතිරේක - හිරාන් ප්‍රියංකර ජයසිංහ*

# අකාරුණික කාලගුණයෙන් නාවලපිටියටත් බර හානි



**හැටන් - රංජිත් රාජපක්ෂ**

නාවලපිටිය දොළොස්බාගේ මාර්ගයේ වැලිගොඩවත්ත ප්‍රදේශයෙන් මාර්ගයට විශාල පස් කන්දක් සමඟ ගස් කඩාවැටීමෙන් රථ වාහන ගමනාගමනය ඊයේ (29) අලුයම 2 සිට සම්පූර්ණයෙන් ඇනහිට ඇති බව නාවලපිටිය පොලීසිය පැවසීය. නාවලපිටිය ප්‍රදේශයට ඇදහැලෙන අධික වර්ෂාව සමඟ එම මාර්ගයට පස් කඳු සහ ගස් වැටී ඇති අතර, විදුලි රැහැන් මතට ගස් කඩාවැටීම හේතුවෙන් නාවලපිටියේ ප්‍රදේශ රැසක විදුලි බල සැපයුමද බිඳවැටී ඇත.

# පදවියේ කොටු වූ ජනයාට නාවික හමුදාවෙන් ප්‍රවාහන පහසුව

**අනුරාධපුර අතිරේක**
**අමිල ප්‍රභාත් වනසිංහ**

පදවිය ජලාශයේ වාන් දොරටු දෙක විවෘත කිරීම හේතුවෙන් ජල ගැලීමෙන් පදවිය කම්බිලිවැව, වෙහෙරතැන්න ඇතුළු ගම්මාන රැසක පුද්ගලයන් දහසක් පමණ අසරණව සිටිති. මේ අතර ජල ගැලීම් හේතුවෙන් වව්නියාව පදවි පරාක්‍රමපුර ප්‍රධාන මාර්ගයේ කම්බිලිවැව සපත්තු පාලම අඩි අටකින් පමණ ජලයෙන් යට වීම නිසා ගමනාගමන කටයුතු ඇනහිට ඇති අතර, නාවික හමුදාව බෝට්ටු මඟින් ජනතාවට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සලසයි. පදවිය ජලාශයේ වාන් දොරටු දෙක මඟින් තත්පරයට ඝන අඩි 4,200ක් පමණ මා ඔයට මුදා හැරේ.



# ඇල්ල පස්සර මාර්ගය යළි යථා තත්ත්වයට



**සොරණාතොට සමූහ - සී. ගමගේ**

ඇල්ල පස්සර මාර්ගයේ 17 කණුව ප්‍රදේශයේදී මාර්ගයට විශාල ෆයිනස් හා ටර්පන්ටයින් ගස් කඩාවැටීමෙන් රථ වාහන ධාවනය මුළුමනින්ම ඇනහිට තිබූ ඇල්ල පස්සර මාර්ගය යුදහමුදා නිලධාරීන් හා මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන් එක් වී පිළිසකර කර රථ වාහන ධාවනයට සුදුසු පරිදි ඊයේ (29) යථා තත්ත්වයට පත් කළ බව මාර්ග සංවර්ධන අධිකාරියේ බදුල්ල විධායක ඉංජිනේරු කාර්යාලය පැවසීය.

අයහපත් කාලගුණික තත්ත්වයත් සමඟ පැවති වර්ෂාව සහ තද සුළං හේතුවෙන් ගස් කඩාවැටී ඇල්ල පස්සර ප්‍රධාන මාර්ගයේ 17 කණුව ප්‍රදේශයේ රථ වාහන ධාවනයට පෙරේදා (28) බාධා සිදු වූ අතර, අනතුරුදායක බව සලකා එම මාර්ගය තාවකාලිකව පොලීසිය මඟින් වසාදමනු ලැබිණි.

# වැහි-හුළං මැද පොල් ගහක් නිවෙසට වැටී අයෙක් මරුට

### ශ්‍රීකාන්තගේ ශ්‍රී දූපත



- චීන ව්‍යාපෘති අසාර්ථක වීම චීනයේ වරදක් නොවේ, කියල චීන තානාපති කියනව බං !
- එහෙනම් රාජපක්ෂලගෙද සර් ?

**මාරවිල සමූහ**
**මිහිර විජේසේකර**

අයහපත් කාලගුණ තත්ත්වය හේතුවෙන් වෙන්නප්පුව තෝප්පුතොට ප්‍රදේශයේ නිවෙසක් මතට පොල් ගසක් කඩා වැටී පුද්ගලයකු මිය ගොස් ඇති බව වෙන්නප්පුව පොලීසිය පවසයි.

මෙසේ මිය ගොස් ඇත්තේ වඩුආරච්චිලාගේ ගෙදර පුංචි බණ්ඩාර නමැති අවුරුදු 74ක් වයසැති සිවිදරු පියෙකි. පෙරේදා (28) සවස ඇදහැලුණ වර්ෂාව හා සුළඟ සමඟ මේ ගස කඩාවැටී තිබේ. ඒ අවස්ථාවේ තුවාල ලැබූ මේ තැනැත්තා මාරවිල මූලික රෝහලට ඇතුළත් කිරීමෙන් පසු හලාවත මූලික රෝහලට මාරු කර යැවීමට කටයුතු කරන අවස්ථාවේදී මියගොස් තිබේ.



මියගිය පුංචි බණ්ඩාර

ගස කඩාවැටෙන අවස්ථාවේ මියගිය අයගේ බිරිය සහ මිය ගිය අයගේ බාල දියණියගේ පුතා සහ දියණිය නිවෙසේ රැඳී සිටි අතර, ඔවුන්ට කිසිදු අනතුරක් සිදු වී නැත.

**ඇනැත්ත**

| | |
|---|---|
| ලාබලු විදුලි බල මණ්ඩලයෙන් | වැඩිය |
| ඉල්ලති සේවකයො බෝනස් සහ | පඩිය |
| සූරා කන නමුත් ජනතාවගෙ | මඩිය |
| රට බංකොලොත් වී ඇත අඩියෙන් | අඩිය |

රටේමුල්ලේ මුදන්නායක

# කලාවැවේ සද්දන්තයාට පින් පමුණුවා ආගමික වතාවත්





**අනුරාධපුර සංචාරක**
**බී.ජී. චතුරංග**
**අනුරාධපුර අතිරේක**
**අමිල ප්‍රභාත් වනසිංහ**

කලා වැව් රක්ෂිතය මෙන්ම කහල්ල පල්ලකැලේ අභය භූමිය සහ ඒ අවට ප්‍රදේශය වාස භූමිය කරගනිමින්, ප්‍රදේශවාසීන්ගේ මෙන්ම දෙස් විදෙස් සංචාරකයන්ගේද ආදරයට පාත්‍රව සිටියදී ජීවිතක්ෂයට පත් දීඝ දන්තු 1 හස්තියා වෙනුවෙන් ආගමික වතාවත් කිරීම ඊයේ (29දා) ඇදහැලුණු වර්ෂාව මධ්‍යයේ සිදු කෙරිණි.

නිවෙසක් අසල අනවසරයෙන් ඇද තිබූ විදුලි රැහැනක ගැටී ජීවිතක්ෂයට පත්ව සිටියදී දීඝදන්තු 1 ඇතාගේ සිරුර පෙරේදා (28) සොයාගත් අතර, එම ආගමික වතාවත් සිදු කෙරුණේ හස්තිරාජයා ජීවිතක්ෂයට පත්ව සිටි ගල්කිරියාගම පොලිස් වසමේ පලාගල හිඟුරුවැව ප්‍රදේශයේදීය. මෙහිදී සංඝරත්නයේ පිරිත් සජ්ඣායනා මධ්‍යයේ, මතකවස්ත්‍ර පූජා කර පැන් වඩමින් ආගමික වතාවත් සිදු කරනු ලැබීය. හුරුළුගං, කලාගං දෙපළාතේ ප්‍රධාන අධිකරණ සංඝනායක හිඟුරු වැවේ පියරතන නාහිමි, උපුල් වෙහෙර රජමහා විහාරස්ථානයේ විහාරාධිපති රාජකීය පණ්ඩිත දාගම ධම්මාලංකාර හිමි ඇතුළු භික්ෂූන් වහන්සේ මෙහිදී ආගමික වතාවත් සිදු කළහ.

වන ජීවී පශු වෛද්‍ය චන්දන ජයසිංහ මහතා ඇතුළු වනජීවී නිලධාරීන්, පොලිස් නිලධාරීන්, ප්‍රදේශවාසීන් ඇතුළු පිරිසක් මේ අවස්ථාවට එක් වී සිටියහ.